චක්‍රලේඛ: අංක 146/86

201/කළ/චක්‍ර
සමුපකාර සේවක කොමිෂන් සභාව
32/1, මාකන්මාකර් මාවත,
ගාලුමුවදොර,
කොළඹ 3.
1986.03.8/ . . . .

සියළුම සමුපකාර සමිති සභාපතිවරුන් වෙත.

ප්‍රසූත නිවාඩු.

අංක 169/8 - 1981.12.01 දිනැති ගැසට් පත්‍රයෙන් ප්‍රසිද්ධ කරන ලද සමුපකාර සේවක කොමිෂන් සභා රෙගුලාසි මාලාවේ 67 වෙනි රෙගුලාසියට

එනම්,

" කාර්යාල වේලාවන්, සති නිවාඩු, වාර්ෂික නිවාඩු, හා හිමිකම් ඇති නිවාඩු, ආණ්ඩුවේ නිවාඩු සහ ප්‍රසූතිකාධාර සම්බන්ධයෙන් වෙළඳශාලා හා කාර්යාල සේවක පනත, වැටුප් මණ්ඩල ආඥා පනත, ප්‍රසූතිකාධාර පනත, හෝ අදාළ වැටුප් මණ්ඩල වල තීරණ බලපවත්නේය. ඉහත කී වර්ග වලට නොවැටෙන සේවකයන් පිළිබඳ වූ සේවා කොන්දේසි කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ. " යන්නට ඔබගේ අවධානය යොමු කරවමි.

ඒ අනුව සමුපකාර සේවකයන්ගේ ප්‍රසූත නිවාඩු දීර්ඝ කිරීම සම්බන්ධව නියෝජ්‍ය කම්කරු කොමසාරිස් විසින් 1986.01.10 දින නිකුත් කරන ලද ලිපියක පිටපතක් මෙයට ඇමිණූ ඇති අතර මින් ඉදිරියට එහි සඳහන් උපදෙස් අනුව ක්‍රියා කිරීමට සටහන් කරගත යුතු බව මෙයින් දන්වමි.

ප්‍රසූතිකාධාර පනත පිළිබඳ නිසි බලධාරියා කම්කරු කොමසාරිස් බැවින් ඊට අදාළ වැඩි දුර උපදෙස් කම්කරු දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාල මගින් ලබාගත හැකි බවද සඳහන් කරමි.

ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව

නිල/11

සමුපකාර සේවා කොමිෂන් සභාව .

මහත්මයාණෙනි,

## ප්‍රසූත නිවාඩු දීර්ඝ කිරීම.

1. 1985 අංක 43 දරණ ප්‍රසූතිකාධාර (සංශෝධන) පනත.
2. 1985 අංක 44 දරණ සාප්පු හා කාර්යාල සේවක (සංශෝධන) පනත.

මෙම සංශෝධන දෙකෙහිම මූලික පරමාර්ථය වන්නේ කාන්තා සේවිකාවන්ට ඔවුන්ගේ පළමුවන හා දෙවන දරු උපත් සඳහා දෙනු ලබන ප්‍රසූතිකාධාරනිවාඩු දීර්ඝ කිරීමයි. 1985 නොවැම්බර් මස 22 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නිකුත් කරන ලද ගැසට් පත්‍රයේ II කොටසට අතිරේකව මෙම සංශෝධන පනත සභාගත කර ඇත. රජයේ ප්‍රකාශන අංශයෙන් මෙම තොරතුරු ඇතුලත් සංශෝධන පනත් මිලදී ගත හැකිය. මෙම සංශෝධන පනත් දෙකම ක්‍රියාත්මක වන්නේ 1985 නොවැම්බර් මස 20 වන දින සිටය.

ප්‍රසූතිකාධාර සංශෝධන ආඥා පනතට අනුකූලව වැඩ කරන කාන්තාවන්ට ප්‍රසූත නිවාඩු සති 12 කට හිමිකම් කිව හැකිය. එම සති 12 ට ඇතුලත් වන වැඩ නොකරන දිනයන් ද එම කාල සීමාවට අයත්වේ. ජීවත්ව සිටින පළමු හා දෙවන දරු උපත් සඳහා පමණක් මෙම නිවාඩුව වලංගු වේ.

සාප්පු හා කාර්යාල සේවක පනතින් ආවරණය වන සේවිකාවන්ට හිමි වන්නේ දින 84 ක ප්‍රසූත නිවාඩුවකි. එසේම සාප්පු හා කාර්යාල සේවක පනතේ වෙනත් වගන්ති යටතේ ඇයට හිමි ප්‍රසිද්ධ හා අනෙකුත් නිවාඩු මෙම දින 84 ට අමතරව ලබා ගැනීමට පුලුවන. එම නිවාඩුවද ජීවත්ව සිටින පළමු හා දෙවන දරු උපත් සඳහා පමණකි.

මෙම පනත් දෙක යටතේ ප්‍රසූතියෙන් සතියක් ඇතුලත ඒ ප්‍රසූතිය සිදුවූ දිනය සේවා යෝජකයා වෙත දැනුම් දිය යුතු අතර ඇයට හිමි නිවාඩු දින ගණන තීරණය කිරීම සඳහා ඒ ප්‍රසූත දිනය වන විට ඇයට සිටින දරුවන් ගණන ද සේවා යෝජකයා වෙත දැනුම් දිය යුතුය.

ප්‍රසූතියෙන් පසුව දරුවෙක් බිහි වුවහොත් සහ ඒ ස්ත්‍රියට ඒ ප්‍රසූත දිනය වන විට දරුවන් දෙදෙනෙක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සිටී නම් හෝ ප්‍රසූතියෙන් පසුව දරුවෙක් බිහි නොවුවහොත් හෝ කළල රූපයක් බිහි කළ හොත් ඇයට හිමි වන්නේ සති 6 ක ප්‍රසූත නිවාඩුව පමණි.

මෙම ප්‍රසූත නිවාඩු පඩි සහිත බව සැලකිය යුතුය.

අ.ක/
නියෝජ්‍ය කම්කරු කොමසාරිස්.

කාන්තා හා ළමා කටයුතු අංශය,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.
1986.01.10